# විශිෂ්ඨත්වයෙන් පිරිපුන් අපේ ඉපැරණි වාරි තාක්ෂණය

**වි**සර 2550 අධික ප්‍රෞඪ අභිමානවත් ඉතිහාසයකට නෑකම් කියන්නා වූ, ශ්‍රී ලාංකේය ශිෂ්ටාචාරය සතුව අතිශය දියුණු ජලාශ්‍රිත ශිෂ්ටාචාරයක් අපහට උරුමව පැවති අතර මෙම ජලාශ්‍රිත ශිෂ්ටාචාරය, අභිමානවත් ශ්‍රී ලාංකේය ජාතියේ කැඩපත බඳු විය. මහාර්ඝ දායාදයක් වූ මෙම ඉපැරණි වාරි පද්ධතිය සුවිශේෂී කරුණු ගණනාවක් නිසාම, ලොව වෙනත් ජලය පදනම් කොට ගොඩනැගුණු ශිෂ්ටාචාරයන් හා සැසඳීමේ දී සුවිශේෂී අනන්‍යතාවයක් උසුලයි. සත්‍ය ලෙසම එය, පුරාතන ශ්‍රී ලාංකේය ජාතියේ විශිෂ්ටතම ප්‍රෞඪ මානව නිර්මාණයක් විය. උසස් දියුණු තාක්ෂණික ඥානයක් පිළිබිඹු වන, මෙම වාරි කර්මාන්ත පද්ධතිය සැබැවින්ම පුදුම එළවන සුළු ය. එය සෑම අතකින්ම විශ්මයජනක බවක් උසුලන්නේ, එහි ඇති දියුණු තාක්ෂණික ඥානය නිසාම නොවේ. පාරිසරික මූලධර්මයන්ට අනුකූලව, පාරිසරික සංරක්ෂණය ඇතිවන පරිදි නිර්මාණය කර ඇති මෙම වාරි පද්ධතියෙහි නඩත්තු කිරීමේ කටයුතු සඳහා චිරසාර කල්පවත්නා ගුණය ද වෙසසින්ම ඇගයීමට බඳුන් කළ යුතු ව ඇති නිසාවෙනි.

චීනයේ "විද්‍යාව හා ශිෂ්ටාචාරය" නැමැති ශ්‍රේෂ්ඨ කෘතියේ "ජෝශප් නීඩ්හැම්" පවසන්නේ "පුරාතන ශ්‍රී ලාංකිකයන් මෙම ශිල්පයෙහි කෙතරම් නිපුණ වී දැයි බැලිය යුතු වෙමු" යනුවෙනි. සැබැවින්ම ඉපැරණි ලාංකිකයෝ වචනයෙන් පරිසමාප්ත අර්ථයෙන්ම වාරි තාක්ෂණික ඥාණයෙහි ලා කෙළ පැමිණි නිපුණයෝ වූහ. ඈත අතීතයේ සිට වර්තමානය දක්වා ම නො නැසී පවත්නා වූ ශ්‍රී ලංකාවේ සතර දිග් භාගයේ ම විසිරී පවතින දහස් සංඛ්‍යාත වැව්, අමුණු, ඇළ, වේළි මඟින් ඒ බව මනාව ස්ඵුට වේ. තව ද, "ආනෝල්ඩ් ටොයින් බී" ට අනුව, මෙරට වාරි කර්මාන්තය විශ්මජනක ය.

පුරාතන ශ්‍රී ලංකාව තුළ මෙතරම් විශාල වූත්, සංකීර්ණ වූත් වාරි පද්ධතියක් විකාශනය වීමෙහි ලා එවකට පැවති ස්වයංපෝෂිත, යහපත් දේශපාලනික, ආර්ථික, සමාජ, සංස්කෘතික පසුබිම ඉවහල් විය. ඒ සඳහා අවශ්‍ය අභිප්‍රේරණය සහ ජවය සැපයූ දර්ශනය කුමක් ද? නිර්මල බුදු දහමින් සහ යහපත් රාජ්‍ය පාලනයෙන් එම දර්ශනය සුපෝෂිත විය.

ශ්‍රී ලංකාවේ ජලාශ්‍රිත ශිෂ්ටාචාරය ආරම්භ වන්නේ ක්‍රි.පූ 06 සියවසේ දී උතුරු ඉන්දියාවේ සිට මෙරටට පැමිණි ආර්යයන් ගෙනි. ආර්යයන්ගේ ප්‍රධාන ජීවනෝපාය වී වගාව මූලික කොටගත් කෘෂිකර්මාන්තය වීමත්, ඒ සඳහා ස්වභාවික ගංගා ජලය ප්‍රමාණවත් නොවීම සහ එම ජලය ලබා ගන්නා ආකාරය ක්‍රමවත් නො වීමත්, වර්ෂාව අවුරුද්දේ එක් කාලයකට පමණක් සීමාවීමත්, වර්ෂාපතනය ප්‍රමාණවත් නොවීම සහ ක්‍රම ක්‍රමයෙන් සිදු වූ ජනගහනය අධිකවීම සහ වගා බිම්වල පුළුල් ව්‍යාප්තිය හේතු කොට ගෙන, වාරි මාර්ග ක්‍රමවල අවශ්‍යතාව පැන නැගුණි ආර්යයන් සතුව පැවති සහජ වාරි කර්මාන්ත ඥානයත්, වියළි කලාපීය හෙල්වැටි අතරින් ගලා බසින ගංගා පැවතීම සහ වියළි කලාපීය තැනිතලා භූමියේ බෑවුම ඇළ මාර්ග තැනීමට පහසුවීමත්, වාරි කර්මාන්තය අතීතයේ දී වඩාත් සීඝ්‍රයෙන් වර්ධනයට වීමට හේතු විය.

පළමු ශත වර්ෂය වන විට ක්‍රම ක්‍රමයෙන් ජනගහනය වැඩිවීම සහ ඊට සමගාමීව ආහාර නිෂ්පාදනය වැඩිකිරීමට සිදුවීමත්, වාරි කර්මාන්තය සඳහා නොමසුරු රාජ්‍ය අනුග්‍රහය ලැබීමත්, ක්‍රමයෙන් ශ්‍රී ලාංකේය ජනදිවිය කෘෂිකර්මාන්තය සමඟ බද්ධවීමත්, නියඟ, සාගතවලට සාර්ථක පිළියමක් ලෙස ද වාරි කර්මාන්තය මෙරට ජනයා අතර සීඝ්‍රයෙන් ප්‍රචලිතවීමට හේතු විය.

රාජ්‍ය අනුග්‍රහය ලැබී ඇති මෙරටින් හමු වී ඇති මානව නිර්මිත ඓතිහාසික ප්‍රථම වැව ලෙස හැඳින්වෙන්නේ අනුරාධපුරය ප්‍රථම වරට තම රාජධානිය කර ගත් පණ්ඩුකාභය රජු විසින් කරවන ලද "බසවක්කුලම" (අභය වැව) වැවයි. ජයවැව හා ගාමිණී වැව ද එතුමාගේ සෙසු නිර්මාණයන් අතර වේ. අනතුරුව දෙවනපෑතිස් රජතුමා (ක්‍රි.පූ. 250-210) විසින් තිසා වැව කරවන ලදී. මෙම අභය වැව හා තිසා වැව වර්තමානයේ දී ද නො නැසී පවතින්නේ පුරාතන වාරි තාක්ෂණයෙහි කල්පවත්නා ගුණය හා නිසි පරිදි නඩත්තු කිරීම හේතුවෙනි.

මහා වංශයට අනුව විශාල වැව් තැනීමේ පුරෝගාමියා වන්නේ වසභ (ක්‍රි.ව. 67-111) රජතුමා ය. මහවිලච්චිය, මානාකැටිය, හිරිවඩුන්න ආදී වැව් 11ක් හා ඇලහැර ඇළ ඇතුළු ඇළවල් 12ක් ද එතුමා විසින් කරවන ලදී. අඹන් ගඟ උපයෝගී කොට ගෙන සැතපුමකට අඩියක් බෑවුම් වන සේ මෙය තනා ඇත. ඇල පතුල, ඇලෙහි බෑස්ම, ඇලෙහි පළල, ඇල බැම්මේ උස, භූමි මට්ටම් හා පසෙහි වයනය ආදී සාධකයන් පිළිබඳ ගැඹුරු අවබෝධයක් එතරම් පුරාතනයේ දී පවා ස්වදේශිකයන්ට තිබූ බව ඒ අනුව පැහැදිලි වේ. වසභ රජුගේ සමයේ උමං ජල තාක්ෂණය (ජලමාතිකා) පවා භාවිතා විය. තිසා වැවේ ජලය රන්මසු උයනට හා කුට්ටම් පොකුණට ගෙන ගියේ උමං ජල තාක්ෂණය උපයෝගී කර ගනිමිනි. ජලමාතිකා තාක්ෂණය, වේලි බැඳීමේ තාක්ෂණය

හා සමෝච්ඡ රේඛාකරණය පිළිබඳ දැනුම ද එකල ස්වදේශික ජනයා සතු වීම තුළ, වාරි කර්මාන්තයෙහිලා ඒ වන විට ද කෙතරම් උසස් ඥණයක් හිමි කරගෙන සිටියේ දැයි යන්න ස්ඵුට වේ.

වාරි කර්මාන්තය උදෙසා සුවිශාල මෙහෙවරක් කළ නිසාවෙන්ම සත් රජ්ජුරු බණ්ඩාර නොහොත් මින්නේරි දෙවියන් ලෙස අදටත් ජනතා වන්දනයට පාත්‍ර වන්නා වූ මහසෙන් රජතුමා (ක්‍රි.ව. 275-301) මහාවංශයට අනුව, මින්නේරිය වැව ඇතුළු ප්‍රධාන වැව් 16ක් ද, ඇළහැර ඇළ ද කරවන ලදී. හුරුළු වැව, කවුඩුළු වැව, මහකනදරා වැව ඒ අතර ප්‍රධාන වේ. ධාතුසේන රජතුමාට ද වාරි කර්මාන්තයෙහි ලා ඉතිහාසයෙහි හිමි වන්නේ අසමසම ස්ථානයකි. කලා වැව ඇතුළු වැව් 18ක් කර වූ එතුමාගේ සුවිශේෂතම නිර්මාණය වූ කලා වැවේ සිට තිසා වැවට ජලය ගෙන යාමට තැනූ යෝධ ඇළ (ජය ගඟ) වේ. ක්‍රි.ව. පස් වැනි සියවසේ ඉදි වූ මෙය, මහත් වූ සංකල්පයක් වන අතර ශ්‍රී ලාංකේය ජල තාක්ෂණයේ මස්තකප්‍රාප්තියයි. සැතපුම් 54 දිගින් යුතු යෝධ ඇළ, පළවෙනි සැතපුම් 17 තුළ සැතපුමට අඟල් 06 ක බෑස්මක් ඇති වන සේ නිර්මාණය කොට තිබේ.

වැවක් නිර්මාණයට නුසුදුසු භූමියක පවා, එම අභියෝගය ජය ගැනීමට තරම් ස්වදේශිකයෝ නිපුණත්වයෙන් පිරිපුන්ව සිටිය හ. ධාතුසේන රජතුමා විසින් කරවන ලද යෝධ වැව ඊට කදිම නිදසුනකි. මෙම මානව නිර්මිත වැව පිහිටුවා ඇත්තේ බෑවුම් තැනි බෑවුමක වන අතර කිසිසේත්ම ගංගා නිම්නයක නොවේ. වාරි තාක්ෂණයෙහි ලා තවත් ඓතිහාසික සන්ධිස්ථානයක් වන්නේ I අග්බෝ රජු (571-604) විසින් මණිමේඛලා අමුණ (මිණිපේ අමුණ) බැඳ, මිණිපේ ඇළ හැරවීමයි. ජනප්‍රවාදයෙහි එය යකා බැඳි ඇළ ලෙස ව්‍යවහාර කෙරේ. කන්තලේ හා ගිරිතලේ වැව් කරවන ලද්දේ II අග්බෝ රජු (604-614) විසිනි. හත්තොට අමුණ මෙතුමාගේ සුවිශේෂී නිර්මාණයකි. අඹන් ගඟේ ප්‍රධාන ශාඛාවක් වූ කළු ගඟ හරහා මෙම අමුණ බැඳ ඉන් හරවාගත් ජලය ඇළ මාර්ගයකට ගෙන ඇළ හැර අමුණට මඳක් ඉහළින් අඹන් ගඟට වැටෙන්නට සැලැස්වීම තුළ මින්නේරි, කවුඩුළු, කන්තලේ හා ගිරිතලේ වැව් එකට යා කෙරෙන ජලාපවාහන පද්ධතියක් නිර්මාණය විය.

ජල දහරාවක් දඟර ගසමින් ගලා බසින විට, එමඟින් එහි වේගය අඩුවීම තුළ, ඒ හරහා වේල්ලක් බැඳ, ඉහළට එසවෙන අතිරික්ත ජලය ඇළ මාර්ග ඔස්සේ පහත් කෘෂිකාර්මික ප්‍රදේශවලට සැපයීම මෙම ඇළ වේලි නිර්මාණය ඔස්සේ සිදු විය. "නීඩ්හැම්", චීනයේ පුරාතන ඇළ මාර්ග පද්ධතිය විස්තර කරමින් "එය සංසන්දනය කළ හැක්කේ ශ්‍රී ලංකාවේ පුරාතන වාරි ඇළ පද්ධතිය සමඟ පමණකි. යුරෝපයේ කිසිවක් සමඟ එය සංසන්දනය කළ නොහැක" යනුවෙන් සඳහන් කරයි.

ශ්‍රී ලාංකේය පුරාතන වාරි ඉතිහාසයෙහි, ස්වර්ණමය යුගය ලෙසට හැඳින්වෙන්නේ පොළොන්නරුව තම රාජධානිය කොටගත් පරාක්‍රමබාහු රාජ්‍ය සමයයි (ක්‍රි.ව. 1153-1186- 11 වන සියවස), "අහසින් වැටෙන එක දිය බිඳුවක්වත් මිනිසාගේ ප්‍රයෝජනයට නොගෙන මුහුදට ගලායෑමට ඉඩ නොදිය යුතු ය" යන්න වූ එතුමාගේ විශිෂ්ට වාරි දර්ශනය. ඒ සමයෙහි පෙරදිග ධාන්‍යාගාරය ලෙසට මෙරට විරුදාවලී ලැබීමට හේතු සාධක විය. විශිෂ්ට වාරි කර්මාන්තයට පසුබිමින් වූ මෙම දර්ශනය, සංවර්ධිත සංකල්පය විශිෂ්ට ලෙස මූර්තිමත් කරනු ලැබීය. පරාක්‍රමබාහු රජු ඉදි කළ හා ප්‍රතිසංස්කරණය කරන ලද ප්‍රධාන වැව් 163 කි. කුඩා වැව් 2,376 කි. ඇළ මාර්ග 3910 කි. වේළි සංඛ්‍යාව 165 කි. මෙතුමාගේ ශ්‍රේෂ්ඨතම නිර්මාණය වන්නේ දුඹුටුළු සහ තෝපා වැව් එකාබද්ධ කොට තැනූ පරාක්‍රම සමුද්‍රයයි. අක්කර 6000 වපසරියකින් යුතු එහි වේල්ලේ උස අඩි 40 ක් සහ දිග සැතපුම් 09 කට ආසන්න වේ.

ඉපැරණි වාරි ඉතිහාසයෙහි මේ සියල්ලක්ම නිමවා තිබෙන්නේ කිසිදු ලෙසකින් හෝ පාරම්පරික සම්පත් හානියක් නොවන පරිදි ය. සංවර්ධන ඉලක්කයන් පමණක් නොව සංරක්ෂණය පිළිබඳ ක්‍රමානුකූල දැක්ම ද විය. එය ක්‍රි.පූ. 03 සියවස දක්වා අතීතයකට නෑකම් කියයි. එදා දෙවනපෑතිස් රජු දඩ කෙළියෙහි යෙදෙන විට "තිස්ස, තිස්ස" යනුවෙන් ඔහු ඇමතූ මිහිඳු මාහිමිපාණෝ "මහරජ අහසේ සරණ කුරුල්ලන්ටත්, වනයේ සිටින සතුන්ටත් මේ බිමෙහි ජීවත්වීමටත්. සැරි සැරීමටත් ඔබ හා සමානම අයිතියක් ඇත. ඔබ හුදෙක් එහි භාරකරුවා පමණකි." යනුවෙන් පැවසූ හ. එලෙස නූතන පාරිසරික නීතියෙහි පළමු මූලධර්මය බුදු දහම මත පදනම්ව. ශාක හා සියලු සත්ත්වයන්ට සාම්ප්‍රදායික නීති පද්ධතියෙන් පැවති ආරක්ෂාව, වාරි තාක්ෂණයෙහි දී පවා මූලික අංගයක් ලෙස සලකා ක්‍රියා කොට ඇත.

ඉහත වාරි කර්මාන්තයන් ගොඩනැඟීමේ දී ස්වදේශිකයන් සතුව මනා ශ්‍රම නිපුණත්වයක් වූහ. "ජේම්ස් එමර්සන්ට" අනුව "කිසියම් කලෙක, කිසිම රටක වාරි නිර්මාණයට මේ හා සමාන මහත් ක්‍රියාකාරීත්වයක් ද, අත්දැකීම් ද සහිත ජන කොටස් නො සිටියහ." යනුවෙන් පවසයි. ඔහු විසින් මධ්‍යම ඊජිප්තුවේ මොඑරිස් ජලාශ්‍රය (Lake Moeris) එමෙන්ම, ගුඩඅල් අරාම්හි ද්‍රෝණිය

(Basin of Al Arom) ට මෙරට වාරි කර්මාන්තය සමාන කොට දක්වයි. ඒ අනුව, ශ්‍රී ලාංකිකයෝ ආශ්චර්යමත් ජාතියක් වූහ යි යනුවෙන් එමර්සන් පවසයි.

අනෙකුත් විෂයයන්ට සාපේක්ෂව වර්තමානයේ දී නීතිය මන්දගාමී වුව ද, වර්තමානය දක්වා මානව උරුමයක් ලෙසට මෙම වාරි ක්‍රමයන් දයාදවීමට, එවැනි වැව්, අමුණු පවත්වාගෙන යාමට තිබූ සම්ප්‍රදායික චාරිත්‍රානුකූල නීති පද්ධතිය ඉතා දියුණු එකක් විය. කුරුල්ලන්ගෙන් සහ වන ජීවීයෙන් ගහන පිරිපුන් වාරි පද්ධතියක් මෙරටට උරුම වූයේ එහෙයිනි. වැව්, අමුණු නිර්මාණයේ දී ස්වදේශිකයාට තිබූ තිරසාර සංවර්ධනය පිළිබඳ පාරිසරික හා නීතිමය ඥනය, දූරදර්ශී දැක්ම හා මනා සැලසුම්කරණය සහ පාරිසරික, සමාජීය හා නීතිමය අනුමිතීන්ගේ අදාළත්වය පිළිබඳ වූ නිපුණතාවය මේ සා සුවිශේෂී සංකීර්ණ වාරි පද්ධතියක් උරුමවීමට හේතු සාධක විය. මෙම සියලු ඓතිහාසික වාරි කර්මාන්තයන් අතර වැවට ලැබෙන්නේ ප්‍රමුඛතාවයකි. වාරි ශිල්පයෙහි නිපුණතා බොහොමයක් වැව සහ වැවට සම්බන්ධ අංග හරහා විද්‍යමානවීම ඊට හේතුවයි. වැව් බැම්ම, සළපනාව, සොරොව්ව, බිසෝ කොටුව, පිටවාන, ඇතුළුවාන, ඉස්වැටි. කළිඟු බැව්, වැව් තාවුල්ල සහ දියකැට පහණ වැවක ප්‍රධාන අංග අතර වේ.

වැවක ජීව කාලය වැව් බැම්මේ ශක්තිමත් බව මත රඳා පවතී. වෑ කන්ද, වැව් කණ්ඩිය, බන්ධන, සේතු යන විවිධ නාමයන්ගෙන් හැඳින්වෙන මෙය ප්‍රවාහන මාර්ගයක් ලෙස ද භාවිතා කළ හැකි ය. වැව් බැම්මෙහි ප්‍රමාණය, උස තීරණය කිරීමේ දී, වැවට එකතු වන ජල ප්‍රමාණය, පෝෂක ප්‍රදේශයට ලැබෙන වර්ෂාපතනය, පහත් බිම් කරා බෙදිය හැකි ජල ප්‍රමාණය හා පිටාර වශයෙන් පිටවන ජල ප්‍රමාණය ආදිය සලකා මිණුම් ශිල්පය උපයෝගි කොටගෙන එය නිර්මාණය කොට තිබේ. මින්නේරිය වැවේ වැව් බැම්ම, පොළොවේ ක්වාට්සයිට් පාෂාණ විහිදීම මත ස්ථානගත කර තිබේ. පාෂාණ සංයුතිය පිළිබඳ සැලකිලිමත් වූ බවට එය කදිම සාක්ෂියකි. සැතපුම් 20 වට ප්‍රමාණයකින් යුතු, ක්‍රි.ව. 275 දී නිර්මිත මින්නේරිය වැවෙහි අති විශාල වේල්ල වර්තමානයටත්, සැලකිය යුතු අඩුලුහුඩුතාවයකින් තොරව ඉතිරිව පවතී. වැවෙහි (ක්‍රි.ව. 82) වැව් බැම්ම ද, සැතපුම් 3.25 දිගු අඩි 40 උස කලා වැවෙහි (ක්‍රි.ව. 05) වැව් බැම්ම ද ඉතා ශක්තිමත්ව වර්තමානයේ දී විද්‍යමාන වේ. අඩි 300 සමෝච්ඡ රේඛාවන්හි විහිදීම මත බැව් බැම්ම සකස් කිරීමේ දියුණු අවස්ථාවක් ලෙසට මින්නේරිය වැව් බැම්ම සහ පරාක්‍රම සමුද්‍රයේ බැම්ම ගෙන හැර දැක්විය හැකි ය. වැව් බැම්ම පිළිබඳ විග්‍රහයේ දී වඩාත්ම හිත් ඇදගන්නා සුළු සොයා ගැනීම වන්නේ ආනතවේල්ල පිළිබඳ මූලධර්මයයි. ක්‍රි.පූ. 01 සියවස මුලදීම ස්වදේශික ඉංජිනේරුවෝ මේ පිළිබඳ අවබෝධයෙන් සිටිය හ. මෙමගින් ජලය කාන්දුවීම වැළකේ. තිරස් අඩි 2 ට හෝ 3 ට සිරස් අඩි 01ක් සමාන වන පරිදි, පිටස්තර සහ ඇතුළු බෑවුම් සකස් කොට ඇත. කලා ඔය, පරාක්‍රම සමුද්‍රය, මින්නේරිය වැව, මාදුරු ඔය එවැනි සීඝ්‍ර බෑවුම් සහිත වැකන්ද අපට දැකගත හැකි ය. තව ද, වියළි කාලවල දී තෙතමනය රඳවා ගැනීමට, වාෂ්පීකරණ ක්‍රියාවලිය මගින් වර්ෂාව ලබාගැනීමට, වැව් බැම්මේ ශක්තියට සහ පස සේදීයාම වැළැක්වීමටත් සෞන්දර්ය උදෙසාත්, වැවේ ප්‍රෞඪත්වය කියා පෑමටත් වැවෙහි වැව් බැම්ම ආශ්‍රිතව ස්වභාවික ශාක ප්‍රජාවක් ස්ථාපිත කොට තිබේ. කුඹුක් ශාකය, මී ශාකය ඒ අතර ප්‍රධාන වන අතර කලා වැව, මින්නේරිය වැව ආශ්‍රිතව වර්තමානයේ දී මෙවැනි ශාකයන් බොහොමයක් දක්නට ලැබේ.

නිරන්තර රළ පහර වැදීමෙන් වැව් බැම්මෙහි සේදී යාම වැළැක්වීමත්, වැව් බැම්මෙහි ආරක්ෂාවටත්, වැව් බැම්මේ ඇතුල් පැත්තේ පාදමේ සිට ඉහළ ජල මට්ටම දක්වා ඇති ගල් ඇසුරුම සළපනාව ලෙස හඳුන්වයි. රළ පැන්නුම, රළ පනාව ලෙසට ද මෙය හඳුන්වයි. මුල් කාලීනව දිය කාන්දුවට ඔරොත්තු දෙන පරිදි, පරිසරයෙන් ලබා ගත් මැටි වර්ග හා හුණු මිශ්‍ර බදම මේ සඳහා යොදා ගෙන ඇත. බදම ඝනත්වය සඳහා ඇටවැරැල්ල මැට්ට යොදා ගෙන තිබේ.

වැවේ ජලය පිටතට මුදා හරිනු ලැබුවේ සොරොව්ව ආධාරයෙනි. බෞද්ධ සාහිත්‍යයෙහි මෙය "උධක නිද්ධමන තුම්හ" ලෙස හඳුන්වා ඇත. ගොඩ සොරොව්ව සහ මඩ සොරොව්ව යනුවෙන් වැවක ප්‍රධාන සොරොව් ද්විත්වයකි. ශ්‍රී ලාංකීය වැව්වල යම් තරමක් හෝ වතුර ඇතිතාක් අඛණ්ඩව එක හා සමාන ලෙස ජලය ගලා යාමට සෑම වැවක්ම පත්ලේ කැන තිබූ ඇල මාර්ග විශ්මයජනක බව 19 වන සියවසේ සිටි ඉතිහාසඥයෙකු වන ශ්‍රීමත් ජේම් එමර්සන් ටෙනන්ට් පවසා ඇත.

සොරොව්ව ඔස්සේ ජලය පිටවීමේ දී වැව් බැම්මේ ආරක්ෂාවටත්, ජල පීඩනය පාලනයටත්, හතරැස් හැඩයට නිර්මාණය කර ඇති බිසෝ කොටුව ශ්‍රී ලාංකික වාරි තාක්ෂණ ශිල්පීය ක්‍රමයේ සුවිශේෂී බව කියා පාන්නකි වංශ කතාවලට අනුව මෙය මුල දී "පණාලි" ලෙස හඳුන්වා ඇත. මුල් යුගයේ දී බිසෝ කොටුව නිර්මාණය කිරීම සඳහා ලී, මැටි උපයෝගී කොටගෙන තිබේ. මෙහි ජල අවකාශය අඩු වැඩි කිරීමට යොදා ගත් පුවරු "ලී මොහොල" (Brober, 1964) ලෙස හඳුන්වයි. ප්‍රධාන ලී පුවරුව "රජ මොහොල" ලෙස හඳුන්වා ඇත. ජල පාලන උපකරණයක් ලෙස වැවෙහි පවතින මෙය සැබැවින්ම වාරි තාක්ෂණයේ මහිමය කියාපාන්නකි.

වැවෙහි අනෙකුත් තාක්ෂණික විධි ක්‍රමය වන්නේ අතිරික්ත ජලය පිටතට ගලායාමට සලස්වා තිබූ "වාන" තාක්ෂණයයි. පිටවාන, ගොඩවාන යනුවෙන් ප්‍රධාන කොටස් දෙකකි. වැව්වල ජල සම්පීඩනය අනුව එයට යොදන වාන් සංඛ්‍යාව තීරණය වේ. ගොඩවාන මඟින් අතිරික්ත ජලය ස්වභාවික ලෙස පිට කිරීම සිදු කරනු ලබයි. ගල් පැන්නුම, ගල්වාන ලෙස ද මෙය හඳුන්වයි. බොහෝ වැව්වල වාන, වැව් බැම්මේ එක් කෙළවරක, ස්වභාවික පහත් ස්ථානයක් තෝරා මඳක් පහත් වන සේ ගල් පුවරු අතුරා සකස් කොට ඇත. පරාක්‍රම සමුද්‍රය, නුවර වැව, තිසා වැව, කලා වැව ඊට නිදසුන් වේ. මුල් යුගයේ දී මේ සඳහා දැව දඬු යොදා ගෙන ඇති අතර ක්‍රි.ව. 01 සියවසෙන් පසු ශිලා තාක්ෂණය උපයෝගී කර ගන්නා ලදී. වැව් පතුල අපවිත්‍රවීම වැළැක්වීම, පිටවාන හා සොරොව්ව ක්‍රියාකාරීත්වයට පහසුවීම, නඩත්තුව පහසුවීමට මඩවාන නිර්මාණය කොට ඇත. වංශ කතාවල මෙය පංකරේණුකාවාට ලෙසින් හඳුන්වා ඇත. රන්මසු උයන, කුට්ටම් පොකුණ ආදියෙහි ද මෙම සූක්ෂම ශිල්පීය ක්‍රමය යොදා ගෙන තිබේ.

වැවෙහි ජල සීමාව මැන බලන ශෛලමය දණ්ඩ දිය "කැට පහන" ලෙස හැඳින් වේ. වෙස්සගිර ශිලා ලිපියෙහි මේ පිළිබඳ තොරතුරු දක්වා ඇත. වැවෙහි ජල පරිමාව කොපමණ ද? ගොඩබිම් ජලය කොපමණ ප්‍රමාණයක් පිටකළ යුතු ද යන්න මෙමඟින් තීරණය කෙරේ.

තිසා වැව, කලා වැව, නුවර වැවෙන් අදට ද අනුරාධපුර නගරයට ජලය සපයන ප්‍රධාන ජලාශ්‍රයන් ය. වර්තමානයේ එය පළාත් අග නගරයකි. බොහොමයක් ඉපැරණි වැව් අමුණු, ඇළ-වේළි වර්තමානයේ දී ජීවමාන ලෙසින් වැජඹීම අතීත හෙළ වාරි ශිල්පයෙහි මහිමය කියාපාන්නකි. තිරසර සංවර්ධන සංකල්පය සම්ප්‍රදායික ලෙස අතිශය සාර්ථකව ක්‍රියාවට නැංවීමට පුරාතනයෝ ඒ පිළිබඳ ගැඹුරු දැක්මක් හා අවබෝධයකින් යුක්තව සිටිය හ. විහාරය, කෙත, වැව හා ගම සහ සම්බන්ධ වූ සංවර්ධිත සංකල්පය හා පරිසරය පිළිබඳ මනා සංහිඳියාවක් පවත්වා ගැනීමට සමත්වූවෝ නම් ඔවුහු ය. ඓතිහාසික ඉපැරණි ලෝක ශිෂ්ටාචාරයන් අතර ශ්‍රී ලාංකේය මානව ශිෂ්ටාචාරය වඩාත් උදාරතර හා ප්‍රෞඩ අතීතයකට උරුමකම් කියන්නේ එහි වූ විශ්මිත වාරි තාක්ෂණ උපක්‍රමික ඥානය නිසාවෙනි. සැබැවින් ම යථෝක්ත ශ්‍රී ලාංකේය වාරි ශිල්පී ඥානය ශ්‍රී ලාංකේය ඉතිහාසයේ සඳ නො මැකෙන සුවිශේෂී මානව විජයග්‍රහනයක් ලෙස සනිටුහන්ව ඇත.

**ආශ්‍රිත ග්‍රන්ථ**

*වීරමන්ත්‍රී, සී.ජේ.; ශ්‍රී ලංකාවේ පුරාතන වාරිමාර්ග පද්ධතියෙහි පාරිසරික සංකල්ප ප්‍රකාශනය: හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය, 2004.*

**එච්.එම්.ජේ.කේ. හේරත්**

*පර්යේෂණ නිලධාරී*

**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය**

◈ ◈ ◈ ◈ ◈ ◈ ◈ ◈ ◈ ◈ ◈ ◈ ◈ ◈ ◈ ◈ ◈ ◈ ◈ ◈ ◈ ◈ ◈ ◈ ◈ ◈ ◈ ◈ ◈ ◈ ◈ ◈ ◈ ◈ ◈ ◈ ◈ ◈ ◈ ◈ ◈ ◈ ◈

## ගොවි ජනතා

"**ගොවි ජනතා**" සඟරාව පිළිබඳව ඔබ දක්වන අදහස් හා ප්‍රතිචාර අපි ඉතා අගය කොට සලකමු. එසේම, ඒවා ඉදිරි කලාපයන් හි පළ කිරීමට ද කටයුතු කෙරේ. එබැවින්, එවැනි ද, සංස්කාරක වෙත දන්වා එවන මෙන් පාඨක ඔබට ආරාධනා කරමු.

**සංස්කාරක**

"ගොවි ජනතා"

**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය,**

**114, විජේරාම මාවත,**

**කොළඹ - 07.**

**94-11-2696981, 2696437, 2698539 - 41** දිගුව 281